2022 සැප්තැම්බර්

# ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ සීමාවාසික වැඩසටහන්

සැකසෙමින් පවතින කෞතුකාගාරයක් ලෙස, MMCA ශ්‍රී ලංකා නව කෞතුකාගාර වෘත්තිකයින් පරපුරටකට නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයක සන්දර්භය තුළ ප්‍රදර්ශන හා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමට සහ ඒවා හා සම්බන්ධවීමට අවශ්‍ය පසුබිම සකස් කරමින් සිටී. ඔවුන් මෙම අභියෝගය ආමන්ත්‍රණයකරන එක් ප්‍රයත්නයක් වන්නේ ඔවුන්ගේ සීමාවාසික වැඩසටහනයි.

වර්තමානයේ කෞතුකාගාරය විසින් ලබාදෙන සීමාවාසිකත්වයන් දෙවර්ගයකි: එනම්, විශ්වවිද්‍යාල සීමාවාසික වැඩසටහන සහ තරුණ වෘත්තිකයින්ගේ සීමාවාසික වැඩසටහනයි. මේ අවස්ථා දෙකේදී ම
සීමාවාසිකයන්ට කෞතුකාගාර කාර්ය මණ්ඩලයේ කෙනෙක් හෝ කිහිපදෙනෙක් සමග සමීපව වැඩකරන හා කාර්යබහුල කෞතුකාගාර පසුබිමක් තුළ වැඩකිරීමේ අත්දැකීම ලබාදෙන තනතුරු සීමාවාසිකයින්ට ලැබෙයි.

විශ්වවිද්‍යාල සීමාවාසික වැඩසටහනට සමගාමීව MMCA ශ්‍රී ලංකා කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකාවේ උපාධි හෝ ඩිප්ලෝමා පාඨමාලා සඳහා බඳවාගත් සිසුන්ට ඉගැන්වීමට ද සම්බන්ධවේ. විශ්වවිද්‍යාල මුල් වූ වැඩසටහනේ ද්විත්ව අවධානය සිසුන්ට සිය අධ්‍යයන කටයුතු වෘත්තීමය කෞතුකාගාර සැකැස්මකට අදාළවන ආකාරය අවබෝධකරගැනීමට ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමට මග සලසයි. අද රැකියා වෙළඳපොල තුළ සුදුසුකම් පමණක් ප්‍රමාණවත් නොවේ. බොහෝ සේවායෝජකයින් සඳහා රැකියාවේ සේවා පළපුරුද්ද වඩාත් වැදගත්වෙමින් පවතී. අද දක්වා යාපනය විශ්වවිද්‍යාලයේ ලලිත කලා අධ්‍යනංශයේ උපාධි අපේක්ෂකයින් දහයක් කලා ඉතිහාසය, අධ්‍යාපන පර්යේෂණ, සහ පරිවර්තනයට අදාළ ව්‍යාපෘතිවලට සීමාවාසිකව බඳවාගෙන ඇත.

වෘත්තීය කෞතුකාගාර සැකැස්මක් තුළ නිශ්චිත සේවා ක්ෂේත්‍රයන්ට රුචියක් දක්වන අයට තරුණ වෘත්තීය සීමාවාසික පුහුණු වැඩසටහන යටතේ සීමාවාසිකත්වයන් ලබාදෙයි. 2022 පෙබරවාරි මාසයේ සිට MMCA ශ්‍රී ලංකා ප්‍රදර්ශන පර්යේෂණ, ප්‍රදර්ශන නිෂ්පාදනය, ග්‍රැෆික් නිර්මාණ, ඩිජිටල් ව්‍යාපෘති, පොදු වැඩසටහන්, අධ්‍යාපන පර්යේෂණ, සහ අධ්‍යාපන දත්ත විශ්ලේෂණය යන ක්ෂේත්‍රයන්හි තරුණ වෘත්තීය සීමාවාසිකයින් දොළොස් දෙනෙකු සමග කටයුතුකර ඇත.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

MMCA ශ්‍රී ලංකාහි සීමාවාසික වැඩසටහන් පිළිබඳ අදහස් දක්වමින් ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා මෙසේ පැවසුවා ය, “කෞතුකාගාරවල සීමාවාසික පුහුණුව ලබන්න මට ලොකු ආසාවක් තිබුණ නමුත් අවශ්‍ය සුදුසුකම් තියෙනවා කියලා හිතුවේ නැහැ. අයදුම්කරන්නන් දිරිමත්කිරීමට MMCA ශ්‍රී ලංකාහි හැකිතාක් සීමාවාසිකත්වයන් ලබාදීමට අපි අවධානය යොමුකරනවා. අපේ සීමාවාසික පුහුණුව අපි අඛණ්ඩව වැඩිදියුණුකරද්දී, මේ අවස්ථා හරහා මා වැනි කලා ක්ෂේත්‍රයේ රැකියාවක් කිසිවිටෙකත් සලකා නොබැලූ තරුණ වෘත්තිකයන් සඳහා වෘත්තීය මාර්ග රෝපණයවනු ඇතැයි මම විශ්වාසකරනවා.”

*MMCA ශ්‍රී ලංකාහි මෙම කාර්යභාරය තුළ සේවය කිරීමට කැමති අයට [jobs@mmca-srilanka.org](mailto:jobs@mmca-srilanka.org) වෙත ඔවුන්ගේ රැකියා අයැදුම්පත විද්‍යුත් තැපෑලෙන් එවිය හැක.*

**[Named Quotes]**

“MMCA ශ්‍රී ලංකාහි මගේ මාස තුනක සීමාවාසික පුහුණුව ඉතාමත් සුවිශේෂී ඉගෙනුම් අත්දැකීමක්. ඒ කාලය තුළ තිරය පිටුපස සිදුවන දේට සහයවීමට මට අවස්ථාවක් ලැබුනා.

ශ්‍රී ලංකාවේ සමහර නූතන හා සමකාලීන කලාව පිළිබඳව පෙර කවරදාටත් වඩා වැඩි දැනුමක් මට ලැබුනු බව මට වැටහුනා. මට මේ අවස්ථාව ලැබීම ගැන වගේම අධ්‍යාපන හා පොදු වැඩසටහන් සහ අභිරක්ෂණ කාර්යයන් යන දෙකම නෙත ගැටීම පිළිබඳව මම සතුටු වෙනවා. ඒවා මට අලුත් සේවා ක්ෂේත්‍රයන් හඳුන්වාදුන්නා.”

රශ්මි සිල්වා
ග්‍රැෆික් නිර්මාණ සහ පොදු වැඩසටහන්
සීමාවාසික
පෙබරවාරි–අප්‍රේල් 2022

“ගාමිණී රත්නවීර කලාකෘති ප්‍රතිනිෂ්පාදනයකිරීම සහ ප්‍රදර්ශන සඳහා මුල් කලාකෘති සකස්කිරීම වෙනුවෙන් දැක්වූ නිශ්චිත අවධානය සහ සැලකිල්ල දැකීමට ලැබීම පුදුමාකාරයි.

මාස ගණනක් පුරාවට සැලසුම්කිරීම, සූදානම්වීම, සහ විශාල වෙහෙසක් දැරීමෙන් අනතුරුව ප්‍රදර්ශනයේ කොටසක් ලෙස මෙම කලාකෘති ඇතුළත්කිරීමේ කාර්යය කෞතුකාගාරය විසින් භාරගත් ආකාරය ගැන මම පුදුම වුනා. අවසාන ප්‍රථිපලය දැකගැනීමට ලැබීම ඇත්තෙන්ම තෘප්තිජනක අත්දැකීමක්.”

නබීල් මර්සූක්
අභිරක්ෂණ හා ප්‍රදර්ශන නිෂ්පාදන සීමාවාසික
පෙබරවාරි–අප්‍රේල් 2022

MMCA ශ්‍රී ලංකාහි සීමාවාසිකයෙකු ලෙස කටයුතුකිරීම ඉතාමත් විචිත්‍රවත් සහ දෑස් විවරකරන අත්දැකීමක්. ප්‍රධාන කණ්ඩායම යටතේ සහ ඔවුන් හා එක්ව වැඩකිරීමෙන් පැරණි කුසලතා ඔපමට්ටම්කරගනිමින් අනපේක්ෂිත අලුත් ඒවා ඉගෙනීමට හැකිවුණා.

විශේෂයෙන්ම, මම කවදාවත් හිතුවේ නැති වෘත්තීය අවස්ථා ඇතිබව එයින් මට අවබෝධ කරදුන්නා- ඒ සියල්ලට ම මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.”

අයිෂා ඇන්වර්
පොදු වැඩසටහන් හා අධ්‍යාපන සීමාවාසික
මැයි-අගෝස්තු 2022

**[Photos]**

https://drive.google.com/file/d/1b3MC3x0mITBnUaUBZ7hbV7gZkEgonOE5/view?usp=sharing
ප්‍රමෝධා වීරසේකර (අධ්‍යාපනය හා පොදු වැඩසටහන් සහය අභිරක්ෂක) සහ අධ්‍යාපන හා දත්ත විශ්ලේෂණ සීමාවාසික තනුජා මනෝහරන් 2022 සැප්තැම්බර් මස කොළඹ Milk and Honey Caféහිදී අධ්‍යාපනික වැඩසටහන් සඳහා භාවිතාකළ යුතු පොත් සමාලෝචනයකරමින් හා මිලදී ගනිමින්. ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය අනුග්‍රහයෙනි, 2022.

https://drive.google.com/file/d/1tDL7IJ8GOBaR6M7oRy32zgFB4x7J_Ad7/view?usp=sharing
තිනාල් සජීව (අභිරක්ෂණ පර්යේෂණ හා ලේඛනගතකිරීම් සීමාවාසික), ඉසිර සුරියආරච්චි (නිර්මාණ හා ඩිජිටල් සීමාවාසික), සහ මැතිව් රොජර් ජෝසේෆ් (ප්‍රදර්ශන නිෂ්පාදන සීමාවාසික) 2022 අගෝස්තු මස “මුණගැසීම්” ප්‍රදර්ශනයේදී. ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය අනුග්‍රහයෙනි, 2022.

https://drive.google.com/file/d/1l6LKi58ep8e9PZT-UK1w5iCPQHpC1KM_/view?usp=sharing
සඳුනි ද ෆොන්සේකා (අභිරක්ෂණ පර්යේෂණ හා ලේඛනගතකිරීම් සීමාවාසික) 2022 වසරේ MMCA ශ්‍රී ලංකාහි කාර්යාල පරිශ්‍රයේදී. ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය අනුග්‍රහයෙනි, 2022.

https://drive.google.com/file/d/1T1zoHWrM9mgF1vlJ89TMYxG12NvkvDq0/view?usp=sharing
තිනාල් සජීව (අභිරක්ෂණ පර්යේෂණ හා ලේඛනගතකිරීම් සීමාවාසික), ඉසිර සුරියආරච්චි (සැලසුම් හා ඩිජිටල් සීමාවාසික), සහ මැතිව් රොජර් ජෝසේෆ් (ප්‍රදර්ශන නිෂ්පාදන සීමාවාසික) 2022 අගෝස්තු මස MMCA ශ්‍රී ලංකාහි ඉවත්ව යන සීමාවාසිකයින්ගේ සමුගැනීමේදී. ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය අනුග්‍රහයෙනි, 2022.

https://drive.google.com/file/d/1Dgqqw1bZUTEPUg6W0pIUAom-1jjzbX45/view?usp=sharing
තනුජා මනෝහරන් සහ චරිත තෝරදෙණිය (අධ්‍යාපන හා දත්ත විශ්ලේෂණ සිමවසිකයින්) සහ මනුජ මල්ලිකාරච්චි (නිර්මාණ හා ඩිජිටල් සීමාවාසික) 2022 අගෝස්තු මස MMCA ශ්‍රී ලංකාහි කාර්යාල පරිශ්‍රයේදී. ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය අනුග්‍රහයෙනි, 2022.